
දඟබෝලේ

# දගබෝලේ

ඩබ්.එම්.ධනූජී දිනෙල්යා කුමාරි නාරන්පනාව

කෘතියේ අයිතිය:- ඩබ්.එම්.ධනූජී දිනෙල්යා කුමාරි නාරන්පනාව

ISBN :- 978-624-208-636-1

# පිදුම

ලේ කිරි කර පොවා මා
වැදූ මාගේ ආදරණීය
මෑණියන්ට, දිවා රෑ
වෙහෙසි ආදරයෙන් මා
රැකබලා  ගන්නා
පියාණන්ට සෙනෙහසින්
පිරිනමමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කොට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්තියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකිඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත

යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# දග බෝලය

දගබෝලය හරිම දගයි එයා අම්මා කියන දේවල් කිසිම දෙයක් අහන්නේ නෑ.

එයා බත් කන්නෙත් නෑ.එයා කැමති සෙල්ලම් කරන්න විතරමයි.හැමදාම ඉස්කෝලේ ඇරිලා එයා යාලුවොත් එක්ක සෙල්ලම් කරන්න යනවා.

ගෙදරදිත් එයා එයාගෙ සෙල්ලම් බඩු වලින් සෙල්ලම් කරනවා.

දගබෝලය එක දවසක් අඩනවා අම්මාට ඇහුනා,
“පුතේ…ඇයි පුතේ මේ අඩන්නේ?”අම්මා දූකෙන් ඇහුවා.

“අනේ අම්මේ අපෙ පන්තියේ යාලුවෝ හැමෝටම අලුත් අලුත් සෙල්ලම් බඩු තියෙනවා…අනේ අම්මෙ මටත් අලුත් සෙල්ලම් බඩුවක් ඇරන් දෙන්නකෝ…”දග බෝලේ අඩ අඩ කිව්වා.

අම්මාට හොදටම දුක හිතිලා අම්මා දග බෝලෙට අලුත් සෙල්ලම් බඩුවක් ඇරන් දුන්නා.

තව දවසක් ආයෙත් සෙල්ලම් බඩුවක් ඉල්ලුවා.අම්මා එයාට සල්ලි මදී කියලා කිව්වා. දගබෝලේ හයියෙන් අඩන්න පටන් ගත්තා. දගබෝලය නවත්තන්න අම්මා ගොඩක් උත්සහ කරා.



එක දවසක දගබෝලේ වැස්සේ සෙල්ලම් කරන්න
ගිහින් දගබෝලෙට හොඳටම උණ හැදුනා.

දගබෝලයගේ අම්මා දගබෝලය අරන් රෝහලට ගියා. “අනේ මහත්තයෝ...පුතාට දෙන්න ඕනෙ බෙහෙත් මොනවද?”දොස්තරගෙන් ඇහුවා, “පුතාට සෙල්ලම් බඩුවක් ඇරන් දුන්නොත් පුතාට හොඳ වෙයි” දොස්තර හිනා වෙවී කිව්වා.

අම්මා පුදුම වුනා.එත් අම්මා පුතාට ලස්සන අලුත් සෙල්ලම් බඩුවක් ඇරන් දුන්නා.



දගබෝලයට දොස්තර දැකලා එයාට ආස හිතුනා. එයාට දොස්තර මහත්වයා වගේ වෙන්න ආස හිතුනා.ඊට පස්සේ එයා හොදට වැඩ කරන්න හිතුවා,එයා ටික ටික ලොකු වුනා...



දගබෝලය ලොකු වෙලා දොස්තර කෙනෙක් වුනා...අම්මාට ගොඩක් සතුටු හිතුනා.අම්මාත් එයාගෙ පුතාගෙන් බෙහෙත් ගත්තා...



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන්

අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගෙනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාතියෙන් වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේරම්.